**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2020**

------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංවිධානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංවිධානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.60,603,536 ක් වූ මෝටර් වාහන 09 ක් පිරිවැය රු.29,840,484 ක විද්‍යාගාර උපකරණ සහ පිරිවැය රු.1,157,589 ක් වූ කාර්යාල උපකරණ දැනටමත් භාවිතා කරමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වල ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෝටර් වාහන නැවත තක්සේරුකර ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ. භාවිතයට ගත නොහැකි විද්‍යාගාර හා කාර්යාල උපකරණ වෙන්දේසියක් මඟින් ඉවත්කර ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 117 ජේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ජීවිත කාලය හෝ ක්ෂය කිරීමේ අනුපාතය, ඵලදායී ජීවිත කාලය තුල ක්ෂය කරන ක්‍රමය දැක්විය යුතු වුවත් පිරිවැය රු.12,337,058 ක් වූ පරිගණක මෘදුකාංග (Computer Software) | ඉදිරි වර්ෂයේ එම අනුපාත වෙන වෙනම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ප්‍රමිතයේ සඳහන් හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය අනුව කටයුතු කර නොතිබුණි.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද රු.3,977,204 ක් ආදායම් හා වගකීම් ලෙස නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණි. | මෙම හඳුනා නොගත් ප්‍රේෂණ හඳුනා ගැනීම සඳහා මහජන බැංකුව වෙත විස්තර ඉල්ලා ලියුම් ඉදිරිපත් කර ඇති අතර බැංකුවද, එම දත්ත ලබා දීමට අපොහොසත් වී ඇත. | ප්‍රධාන කාර්යාලය වෙත කරනු ලබන ප්‍රේෂණ හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස්කර එම ප්‍රේෂණ නිවැරදිව ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබුණු ලැබිය යුතු හා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු පිළිවෙළින් රු.7,966,743 ක් සහ රු.4,448,125 ක් වූ අතර එම ශේෂ අදාල ගිණුම්වලින් කපා හැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙනත් වියදම් ගිණුමට ගලපා තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ වෙනත් වියදම් රු.3,528,282 කින් වැඩියෙන් සහ වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පසුගිය වර්ෂවල මිලදී ගැනුම් සඳහාවූ ගොඩනැගීමේ බද්ද වියදමක් ලෙස සටහන් නොකර වත්කමක් ලෙස වැරදියට සටහන් කිරීම මේ වර්ෂයේදී නිවැරදි කරන ලදී. | ඉකුත් වර්ෂ වලට අදාල ජාතිය ගොඩනැගිමේ බදු නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස වර්ෂ ගණනාවක සිට පැවත එන රු.6,016,209 ක ශේෂයක් 2020 දෙසැම්බර් 31 දින උප කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ගිණුමට වියදමක් ලෙස ගලපා තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් ද, ලාභය අඩුවෙන් ද දක්වා තිබුණි. | එකතුකල අගය මත බද්ද වියදමක් ලෙස සටහන් කලයුතු නමුත් වැරදීමකින් වත්කම් ලෙස සටහන් කරන ලදී. එය මේ වර්ෂයේදී නිවැරදි කරන ලදී. | එකතු කළ අගය මත බදු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 30 අවුරුදු බදු පදනම මත රු.7,965,000 ක බදු මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඉඩමක් ලබාගෙන තිබුණ ද සංවිධානය සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එම ඉඩමේ නෛතික හිමිකම සංවිධානය වෙත ලබා ගැනීමට කටයුතු නොකර එම ඉඩමේ වටිනාකම වූ රු. 7,965,000 ක මුදල දේපල පිරියත උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මේ සඳහා බදු ගිවිසුම පිළියෙල කරමින් පවතී. නමුත් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කරන ලද ඉඩම පැවරීමේ ලියුමක් ඇත. | සංවිධානය සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර බදු ගිවිසුමක් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රදාන මගින් මිලදී ගත් වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු ක්‍රමක්ෂය ප්‍රමාණය වූ රු.51,153,455 ක් ආදායම් ප්‍රවේශය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරන බව අනාවරණය කර තිබුණද, ඉහත ක්‍රමක්ෂය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම SLPSAS 11 අනුව සිදු කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | රජයේ ප්‍රදාන මගින් මිලදී ගත් වත්කම් වලට අදාල ක්‍රමක්ෂය මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |
| (ඊ) | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ වත්කම් අත්පත් කර ගැනිම් ලෙස රු.2,264,498 ක හඳුනා නොගත් ශේෂයක් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබුණු අතර ඒ සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ වත්කම් අත්පත් කරගැනීම ලෙස රු.2,264,498 ක හඳුනානොගත් ශේෂයක් පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබුණු අතර එය ඉදිරි වර්ෂයේදී ආදායම් ප්‍රකාශය තුල ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | හඳුනානොගත් ශේෂ හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ගැලපිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය පදනම මත සේවා සැපයීම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවුවද ණයට සේවාවන් සැපයීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.62,155,575 ක ණයගැති ශේෂ පැවතුණු අතර එය 2014 සිට 2020 දක්වා කාලයට අදාල විය. | රු.මිලියන 5.2 ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් නොලැබෙන නිසාද කපා හැරීමට ණය එකතු කිරිමේ කමිටුව නිර්දේශ කරන ලදී. එම නිර්දේශය ඉදිරි අන්තර් කළමනාකරණ කමිටු රැස්වීමේ අනුමැතියට යොමු කිරිමට නියමිතය. ඉතිරි ණය ශේෂ සඳහා Letter of Demand යවා ඇති අතර ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ණය අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතු අතර ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.118,236,114 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා ගෙන නොතිබුණි. | මෙම මුදලෙන් රු.මිලියන 96 ක් නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහාද, රු.මිලියන 5.5 ක් නව පරිගණක පද්ධතිය සඳහාද ගෙවා ඇත.මෙම කාර්යයන් අවසාන වූ පසු එම මුදල වත්කම් ගිණුම්වලට ගැනීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි මුදලද එක් එක් කාර්යයන් අවසානයේදී ගැලපීමට කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | වටිනාකම<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගන්නා නිලධාරීන් විසින් කාර්ය නිම කළ විගස අත්තිකාරම පියවිය යුතු වුවද අවස්ථා 54 කදී ලබාගෙන තිබුණු | 1,182,500 | විශේෂ අත්තිකාරම් ලබා ගනුයේ බොහෝවිට වැඩබිම්වල සිදුවන වියදම් පියවා ගැනීම සඳහා වේ. මෙම වැඩබිම් බොහොමයක් ප්‍රධාන | ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අත්තිකාරම් පියවීම සඳහා දින 32 සිට දින 102 ක කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | | කාර්යාලයෙන් දුර බැහැර ඒවා වේ. එම නිසා දින 14 ක් තුල පියවීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතී. | යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.22 වගන්තිය . | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 02 ක් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේදී දින 21 ක අවම කාල සීමාවක් දිය යුතු වුවද ඒ සඳහා ලබා දී තිබුණේ දින 16 ක් පමණි. | 61,845,848 | රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා ව්‍යාපෘති වල සිදුවූ ප්‍රමාදය වලක්වා ව්‍යාපෘති කඩිනම් කිරීමේදී ඉහත දින ගණන් අඩු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජුනි 18 දිනැති අංක NBRO/AD/2019/132 දරන අධ්‍යක්ෂ මුදල්ගේ ලිපිය | කලින් ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල පියවන තුරු අත්තිකාරම් ලබා නොදෙන බව දන්වා ඇතත් කලින් ලබා ගත් අත්තිකාරම් මුදල පියවා නොතිබියදී නැවත අත්තිකාරම් ලබා දී තිබුණි. | 28,145 | විශේෂ අත්තිකාරම් ලබා ගනුයේ බොහෝවිට වැඩබිම්වල සිදුවන වියදම් පියවා ගැනීම සඳහා වේ. මෙම වැඩබිම් බොහොමයක් ප්‍රධාන කාර්යාලයෙන් දුර බැහැර ඒවා වේ.එම නිසා දින 14 ක් තුල පියවීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතී. | අත්තිකාරම අදාළ කාල සීමාව තුල පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2017 දෙසැම්බර් 19 දිනැති අංක DMS/1508 vol viii හා 2017 හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය | නායයෑම් අවදානම් අවම කිරීමේ උපදේශන කොන්ත්‍රාත් ඉටු කිරීම සඳහා නිළධාරීන් 33 දෙනෙකුට චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව වැටුප් හා සේවක අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි. | 11,126,348 | මෙම කටයුතු සඳහා විශේෂඥ පුද්ගලයින් බාහිරින් බඳවා ගතහොත් ඒ සඳහා විශාල වැටුපක් ගෙවීමට සිදුවන බැවින් මෙම ගෙවීම් කර ඇත. | චක්‍රලේඛය පරිදි ගෙවීම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,169,666 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 55,239,903 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,070,237 ක පිරිහීමක් විය. මෙම පිරිහීමට ව්‍යාපෘති කළමනාකරණ අංශයේ අතිරික්තය රු.9,165,576 කින්ද, මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ අංශයේ අතිරික්තය රු.3,185,800 කින්ද, ගොඩනැගිලි පර්යේෂණ අංශයේ අතිරික්තය රු.1,155,671 කින්ද, භූ තාක්ෂණික සහ ඉංජිනේරු අංශයේ අතිරික්තය රු.9,237,577 කින් ද, පරිසර අධ්‍යාන හා සේවා අංශයේ අතිරික්තය රු.2,492,502 කින් ද, අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

**2.2.1 පර්යේෂණ සංවිධානයේ එක් එක් අංශවල අතිරික්තය 2019 වර්ෂයට සාපේක්ෂව වර්ධනය වීම හෝ පිරිහීම**

නාය යෑම් පර්යේෂණ සහ අවදානම් කළමණාකරණ අංශයේ අතිරික්තය 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී සියයට 12 ක වර්ධනයක් වු අතර පරිසර අධ්‍යන හා සේවා, භූ තාක්ෂණික හා ඉංජිනේරු, ව්‍යාපෘති කලමනාකරණ, මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ හා ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ යන අංශවල 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී පිළිවෙලින් සියයට 28,64,96,77,69 ක පිරිහිමක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වනවිටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉල්ලීම් සිදුකර ඇති බව වාර්තා කරමි. | කඩිනමින් පනත සම්මත කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් නායයෑම් අවදානම් තක්සේරු වාර්තා ඉල්ලුම්පත් 1,168 ක් සඳහා නිර්දේශ ලබා දී නොතිබුණි. එය ලැබුණු මුළු තක්සේරු වාර්තා ඉල්ලුම්පත් වලින් සියයට 13.6 ක් විය. | 2020 වර්ෂයේ පැවැති Covid - 19 වසංගතය හේතුවෙන් ක්ෂේත්‍ර කටයුතු නිසි පරිදි කරගත නොහැකි විය. ඒ හේතුවෙන් ලැබුණු LAB/LAD ඉල්ලීම් 8,542 න් 1,168 කට වාර්තා ලබා දිය නොහැකි විය. | ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉඩම් පරීක්ෂාව සහ සංවර්ධන කටයුතු සඳහා ලද ඉල්ලුම්පත් පරීක්ෂාකර කඩිනමින් නිර්දේශ ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී නාය යෑම් සමීක්ෂණය සඳහා ඉල්ලුම්පත් 7,879 ක් ලැබී තිබූ අතර ඉන් ඉල්ලුම්පත් 3,717 ක් සඳහා වාර්තා දී තිබූ අතර<br>සමාලෝචිත වර්ෂයේදී නාය යෑම් සමීක්ෂණය සඳහා ලැබුණු ඉල්ලුම්පත් 4,162 කට නිර්දේශ ලබා දී නොතිබුණි. එය වර්ෂය තුල නිර්දේශ ලබා දිම සඳහා ලද ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 52.8 ක ප්‍රතිශතයක් විය. | 2020 වර්ෂයේ පැවති Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර කටයුතු නිසි පරිදි සිදු කිරිමට නොහැකි විය. | නාය යෑම් සමීක්ෂණ ඉල්ලුම්පත් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකර කඩිනමින් නිර්දේශ ලබා දීමට කටයුතු කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්තාපනය හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන්, ලැබී තිබූ රු.මිලියන 8 ක් සහ නාය යෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත ලැබී තිබූ රු.මිලියන 5 ක් උපයෝජනය කර නොතිබුණු අතර නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබූ රු.මිලියන 97.25 න් රු.මිලියන 11.89 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී මෙම මුදල් උපයෝජනය කිරීමට බලාපොරොත්තු වෙමු. | ප්‍රදානයන් සහ ප්‍රතිපාදනයන් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානයේ නව කාර්යාල සහ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගිවිසුම ප්‍රකාරව දින 240 කින් නිම කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විට | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීමට කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් තොරවූ විවිධ හේතූන් ද බලපාන ලදී. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දින 1016 ක කාලයක් ගතවී තිබුණද ප්‍රමාද ගාස්තු රු.3,650,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කළ වැඩ වාර්තාවන්ට අනුව රු. 51,730,418 ක් වටිනා වැඩ අළුතින් ඉටුකර ඇති අතර රු. 63,927,288 ක් වටිනා වැඩ සැලසුම්වලින් ඉවත් කර තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ අංශයේ නිලධාරීන්ගේ ප්‍රමාද දෝෂයන් හේතුවෙන් රු.13,271,473 ක් අතිරේකව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුවී තිබුණි. | | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩල 386 ක් වුවද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 424 ක් විය. ඉන් සේවකයින් 98 ක් ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් වන අතර කාර්යය මණ්ඩල පුරප්පාඩු 62 ක් පවතින බව නිරීක්ෂණය විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 386 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට අමතරව ආයතනයට අවස්ථාවෙන් අවස්ථාවට ලැබෙන විශේෂ උපදේශනාත්මක වැඩ සඳහා එම කාර්යයට සීමාවනසේ වරින් වර අනියම් පදනමින් සේවකයින් ලබා ගැනීම සිදු කරනු ඇත. | අදාල අනුමැතින් ලබාගෙන බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති පරිදි සේවකයන් බඳවා ගත යුතු වේ. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානයේ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල වෙත කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී ධාවනය කළ යුතු අවම දුර උපයෝජනය වන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් අවස්ථා 34 කදී රු.599,512 ක් සංවිධානයට වැඩිපුර දැරීමට සිදු වී තිබුණි. | ටෙන්ඩර් ගිවිසුම අනුව අවම කි.මී. සංඛ්‍යාවට අඩුවෙන් ධාවනය වුවද ගිවිසගත් අවම කි.මී. සංඛ්‍යාවට ගෙවිය යුතුව ඇත. මෙම ගෙවීම් ආයතනයට වාසිදායක තත්වයට පත්කර ගැනීම විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර වාහන ඌණ උපයෝජනය අවම කර ගැනීම සඳහා කටයුතු කර ඇති බව දන්වමි. | කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී ධාවනය කළ යුතු අවම දුර උපයෝජනය වන පරිදි කටයුතු කළ යුතුය. |